එදිනෙදා චීන බස

每日汉语

僧伽罗语 01

国家汉办/孔子学院总部
Hanban/Confucius Institute Headquarters

中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

中国国际广播出版社

01

එදිනෙදා චීන බස

每日汉语

中国国际广播出版社

《每日汉语》编辑委员会

主　　编：王庚年　许　琳

副 主 编：尹　力　马箭飞

执行主编：李　萍　王刚建　杨　磊　何劲草
安晓宇　于　宽　林少文　高世军

编　　委：孙文正　杨滨源　李培春　童拉格
张雯雯　关　锐　牛道斌　孙景立

编　　务：莫志伟　刘根芹　刘双燕　王瑞芬

目录 / පටුන

第一课　打招呼

1වැනි පාඩම　ආමන්ත්‍රණය 1

第二课　感谢

2වැනි පාඩම　ස්තුති පළ කිරීමේ ආකාර 11

第三课　祝你生日快乐

3වැනි පාඩම　ඔබට සුබ උපන් දිනයක් වේවා 20

第四课　告别

4වැනි පාඩම　සමුගැනීමේදී 30

第五课　求助

5වැනි පාඩම　උදව්වක් ඉල්ලීමේදී 42

第六课　约会

6වැනි පාඩම　හමුවීමකට වෙලාවක් වෙන් රගැනීමේදී 53

目录 / පටුන

第七课　打电话

7වැනි පාඩම　දුරකථන ඇමතුමක් ගැනීමේදී ………… 63

第八课　谈论他人

8වැනි පාඩම　අන් අය ගැන කථා කිරීමේදී ………… 73

第九课　谈论情感

9වැනි පාඩම　හැඟීම් පිළිබඳ කථා කිරීමේදී ………… 83

第十课　谈论工作

10වැනි පාඩම　රැකියා පිළිබඳ කථා කිරීමේදී ………… 92

此为试读，需要完整PDF请访问：www.ertongbo

第一课　打招呼

1වැනි පාඩම　ආමන්ත්‍රණය



ෂෙංලි : ආයුබෝවන් !ප්‍රිය අසන්නෙනි ඒදිනෙදා චීන බස වැඩසටහනට අපි ඔබව සාදරෙන් පිළිගන්නවා. මේ අලුත් වැඩසටහන අපේ අසන්නන්ට නැවුම් ඇරඹුමක් වේවි.

කස්සප: ආයුබෝවන් ! මම චීනයේ ජීවත් වන්නේ දැන් වසර දෙකක කාලයක තිස්සෙයි. ඒත් මගේ චීන භාෂාව නම් තියෙන්නෙ තවම මූලික මට්ටමකයි. ඒ නිසා වැඩසටහනට සවන් දෙන ඔබත් මමත් චීන භාෂා දැනුම අතින් නම් ඉන්නේ එකම මට්ටමෙයි. හරියට හෝඩියෙ පන්තියෙ වගේ.

ෂෙංලි: ඉතින් ඒ හින්දයි අපි කල්පනා කළේ 'ඒදිනෙදා චීන බස ' මගින් මුළ ඉඳලා චීන භාෂාව උගන්වන්න. එහෙම නම් අපි කොහෙන්ද පටන් ගන්නෙ ?

කස්සප : අපි ඉස්සෙල්ලාම චීන භාෂාවෙන් කෙනෙකුට ආමන්ත්‍රණය කරන විදිහ ඉගෙන ගනිමු.

ෂෙංලි: හොඳයි. එහෙම නම් අපි අද පාඩමේ මූලික කරුණු මොනවද බලමු.

කස්සප: අද පාඩමේ මූලික අවධානය යොමු කරන කරුණු.

今日关键 අද පාඩමෙන් අවධානය

Nǐ hǎo.

你 好 。ආයුබෝවන්.

Nǐ jiào shén me míng zi ?

你 叫 什 么 名 字?

ඔයාගේ නම මොකක් ද?

Zhè shì wǒ de míng piàn.
这是我的名片。
මේ මගේ ව්‍යාපාරික හැඳුනුම්පත්‍රය.
Hǎo jiǔ bú jiàn.
好久不见。
සෑහෙන කාලෙකින් දැක්කේ නෑ.

ෂෙංලි : චීන භාෂාවෙන් ආයුබෝවන් කියන විධි කිහිපයක්ම තියෙනවා. හැබැයි වඩාත් වැඩියෙන් කියන්නේ 你好 කියලා යි. 你 කියන්නේ 'ඔයා' 好 කියන්නේ 'හොඳය'. ඒ කියන්නේ 'ඔයා හොඳයි' වගේ අදහසක් තමයි ඒ වචන දෙකේ එකතුවෙන් කියවෙන්නෙ. ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙකුට 你好 කියලා ආමන්ත්‍රණය කරන්න පුළුවන්. 你好 කියලා හඳුනන අයෙකුට වගේම නාඳුනන කෙනෙකුට වුණත් ආමන්ත්‍රණය කරන්න පුළුවන්.

ෂෙංලි: 你好 උච්චාරණය කරන්නේ හරියට ඉංග්‍රීසි භාෂාවෙන් 'knee' සහ 'how' කියන වචන ශබ්ද කරන විදිහටයි. යම් කෙනෙක් 你好 කියලා ඔබව ආමන්ත්‍රණය කළොත් ඔබ කොහොමද ප්‍රතිචාර දැක්විය යුත්තේ ?

කස්සප: අපිට කවුරු හරි ආයුබෝවන් හරි ඉංග්‍රීසියෙන් යස. කියලා කිව්වොත් අපි ආපහු ප්‍රතිචාර දක්වන්නෙත් ඒ වචනෙන්ම නෙ. ඉතින් චීන භාෂාවෙනුත් එහෙම ද ?

ෂෙංලි: හරියටම හරි කවුරු හරි ඔබට 你好 කිවුවම ඔබත් ඒ කෙනාට ප්‍රතිචාර විදිහට ආපහු 你好 කියන්න. දැන් මම

කිවුවට පස්සේ ඔබත්. කියන්න. 你好。

කස්සප: 你好。

ෂෙංලි: හොඳයි ඒ ව්‍යාකරණමය යෙදුමයි. දැන් සංවාදයට සවන්දෙන්න.

对话一 පළමු සංවාදය

A: 你好。ආයුබෝවන්.

B: 你好。ආයුබෝවන්.

A: 您好。ආයුබෝවන්.

B: 您好。ආයුබෝවන්.

කස්සප: හොඳයි දැන් ආමන්ත්‍රණය කළාට පස්සේ ඔහුගේ හෝ ඇයගේ නම දැනගන්නෙ කොහොම ද ?

ෂෙංලි: ඔබට පුළුවන් 你叫什么名字? කියලා අහන්න.

කස්සප: 你叫什么名字?

ෂෙංලි: 你, ඔයා.

කස්සප: 你。

ෂෙංලි: 叫, හඳුන්වන්නේ.

කස්සප: 叫。

ෂෙංලි: 什么, මොන, මොකක්ද.

කස්සප: 什么。

ෂෙංලි: 你叫什么名字? මොකක් ද ඔයාගේ නම 你叫什么名字?

කස්සප: 你叫什么名字?

ෂෙංලි : හොඳයි දැන් සාවදානයෙන් යුතුව සංවාදයට සවන්දෙන්න.

对话二 දෙවන සංවාදය

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 我叫王龙。මගේ නම වං ලංන්.

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 刘陆。ලියු ලු. (නමක්)

ෂෙංලි: ඔබට වෙනසක් තේරුණාද ?

කස්සප: වෙනස තියෙන්නේ ඔබ ප්‍රතිචාර දක්වන විදිහ අනුව. ඔබට පුළුවන් ආපසු පිළිතුරු දෙන විට 我叫 (මගේ නම) කියලා හෝ නැත්නම් එය නැතුව හෝ නම කියන්න.

ෂෙංලි: ඔයා දක්ෂයි. ඒක තමයි වෙනස. අපි තව එය පුරුදු වෙමු. 你叫什么名字? ඔයාගේ නම මොකක්ද?

කස්සප: 你叫什么名字?

ෂෙංලි : මේ කාලේ චීනේ මිනිස්සු තමන්ගේ ව්‍යාපාරික හැඳුනුම්පත්‍රය එහෙම නැත්නම් තමුන් හා සම්බන්ධ විය හැකි ආකාර සඳහන් කළ කුඩා කාඩ් එකක් හුවමාරු කරගැනීම බොහොම සුලභ සිදුවීමක්. තමන්ගේ නම පත කෙනෙකුට ලබා දෙන විට 这是我的名片 මේ මගේ නම පත කියලා කියනවා

කස්සප: 这是我的名片 එතකොට මොකක් ද 名片 කියන්නේ? 'නම පත' ද ?

ෂෙංලි: ඔව් 'නම පත'තමයි. 名片。

කස්සප: 名片。

ෂෙංලි: 这, කියන්නේ 'මේ' කියන එකයි.

කස්සප: 这。

ෂෙංලි: 是, කියන්නේ 'තමයි' කියන එක.

කස්සප: 是。

ෂෙංලි: 我的, කියන්නේ 'මගේ' කියන එකට.

කස්සප: 我的。

ෂෙංලි: 这是我的, කියන්නේ 'මේක මගෙයි' කියන අදහස.

කස්සප: 这是我的。

ෂෙංලි: 名片。 නම පත.

කස්සප: 名片。

ෂෙංලි: 这是我的名片。 මේ මගේ නම පත.

කස්සප: 这是我的名片。

对话三 තෙවන සංවාදය

A: 这是我的名片。 මේ මගේ නම පත.

B: 谢谢。 ස්තුතියි.

A: 好久不见。你好吗？ සෑහෙන කාලෙකින් දැක්කේ නෑ. ඔයාට කොහොමද?

B: 挺好的。谢谢。 බොහොම හොඳින් ස්තුතියි.

ෂෙංලි: 这是我的名片。 මේ මගේ නම පත.

කස්සප: 这是我的名片。

ෂෙංලි: 名片, නම පත.

此为试读，需要完整PDF请访问：www.ertongbo

කස්සප: 名片。

ෂෙංලි: දැන් අපි තවත් වාක්‍යයක් ගනිමු. ඔයාගේ මිතුරා සෑහෙන කාලෙකින් හමු වෙලා නෑ වගේ. එතකොට කොහෙමද අපි සිංහලින් ඒක කියන්නේ?

කස්සප: සිංහලින් කියන්නෙ සෑහෙන කාලෙකින් දැක්කේ නෑ.

ෂෙංලි: චීන භාෂාවෙන් අපි කියන්නේ 好久不见 කියලා.

කස්සප: 好久不见。

ෂෙංලි: 'සෑහෙන කාලෙකින් දැක්කෙ නෑ' කියන අදහසමයි ඒකෙත් තියෙන්නේ. 好久 සෑහෙන කාලෙකින්.

කස්සප: 好久。

ෂෙංලි: 不, නැහැ.

කස්සප: 不。

ෂෙංලි: 见, දකිනවා.

කස්සප: 见。

ෂෙංලි: 好久不见。 සෑහෙන කාලෙකින් දැක්කේ නෑ.

කස්සප: 好久不见。 තෙවන සංවාදයට තවත් වතාවක් සවන්දෙන්න.

对话三 තෙවන සංවාදය

A: 这是我的名片。 මේ මගේ ව්‍යාපාරික හැඳුනුම්පත්‍රය.

B: 谢谢。 ස්තූතියි.

A: 好久不见。你好吗? සෑහෙන කාලෙකින් දැක්කේ නෑ. ඔයාට කොහොමද?

B: 挺好的。谢谢。බොහොම හොඳින් ස්තූතියි.

ෂෙංලි : හොඳයි ඒ තමයි අවසන් සංවාදය. සී.ආර්.අයි. සිංහල සේවයේ 'ඒදිනෙදා චීන බස' වැඩසටහනට සවන් දෙන ඔබට අද පාඩමේ සම්පූර්ණ සංවාදයට ආපහු සවන්දෙන්න පෙර අද අපි ඉගෙන ගත් දේ ඉක්මනින් ආපහු මතක් කර ගනිමු. අපි ඉගෙන ගත්තා චීනෙන් ආයුබෝවන් කියන්න ඒ තමයි 你好。

කස්සප: 你好。

ෂෙංලි: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

කස්සප: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

ෂෙංලි: අපි සඳහන් කළා නම පත හුවමාරු කරන විට 这是我的名片 කියලා කියන්න.

කස්සප: 这是我的名片。 මේමගේ නම පත.

ෂෙංලි: අපි ඉගෙන ගත්තා සෑහෙන කාලෙකින් දැක්කේ නෑ කියලා කියන්න ඒ තමයි 好久不见。

කස්සප: 好久不见。

ෂෙංලි: දැන් අද සම්පූර්ණ සංවාදයට යළිත් සවන් දෙමු.

完整对话 සම්පූර්ණ සංවාදය

对话一 පළමු සංවාදය

A: 你好。ආයුබෝවන්.

B: 你好。ආයුබෝවන්.

A: 您好。ආයුබෝවන්.

B: 您好。ආයුබෝවන්.

对话二 දෙවන සංවාදය

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 我叫王龙。මගේ නම වං ලංන්.

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 刘陆。ලියු ලු. (නමක්)

对话三 තෙවන සංවාදය

A: 这是我的名片。මේ මගේ නම පත.

B: 谢谢。ස්තූතියි.

A: 好久不见。你好吗? සෑහෙන කාලෙකින් දැක්කේ නෑ. ඔයාට කොහොමද?

B: 挺好的。谢谢。බොහොම හොඳින් ස්තූතියි.

ෂෙංලි: සෑම වැඩසටහනක් අවසානයේ 'චීන සංස්කෘතියෙන් බිඳක්' කියන කුඩා විශේෂාංගයකුත් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ ඒ ඇසුරෙන් කැපී පෙනෙන චීන ගති සිරිත් ඔබට හඳුන්වා දෙන්නත් සංස්කෘතික වෙනස්කම් අවබෝධ කරවීමේත් අරමුණෙනුයි.

කස්සප: 'චීන සංස්කෘතියෙන් බිඳක් තුළින් අද අපි කියලා දෙන්නේ මොකක් කියන බලමු.

චීන සංස්කෘතියෙන් බිඳක්

'චීන සංස්කෘතියෙන් බිඳක' තුළින් මා පැහැදිලි කරන්න යන දේ

ඔබත් සමහර විට හඳුනාගන්න ඇති. 你好 කියන සුලභ ආමන්ත්‍රණය වෙනුවට සමහර විටෙක 您好 කියන යෙදුම ඔබට අසන්න ලැබෙනවා. 你 好 කියා අපි සාමාන්‍යයෙන් ආමන්ත්‍රණය කරන්නේ සමාන වයසේ හෝ සමාජයේ සමාන තලයේ හෝ සිටින අය සමගයි. හැබැයි වයසින් වැඩිහිටි හෝ සමාජ මට්ටමින් උසස් අයෙකුට අපි 您 好 කියලා ආමන්ත්‍රණය කරන්නේ ඔහුට හෝ ඇයට ගරුත්වය හා විනීතබව පෙන්වීමටයි.

කස්සප: ඒ සමගින් අද වැඩසටහනින් සමුගැනීමට කාලය උදාවෙලා.

ෂෙංලි: සමුගැනීමට පෙර අපි පුංචි ප්‍රශ්නයක් අහනවා. 'සෑහෙන කාලෙකින් දැක්කෙ (නෑ)' කියලා කොහොම ද චීන බසින් කියන්නේ ?

ෂෙංලි: ඔබේ පිළිතුරු අපේ විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

කස්සප: sgb01cn@yahoo.com.cn

ෂෙංලි: අපේ වැඩසටහනට අන්තර්ජාලය ඔස්සේත් සවන් දිය හැකියි.

කස්සප: http://www.cri.cn

ෂෙංලි: යළි හමුවෙන තුරු 再见。

第二课　感谢

2වැනි පාඩම　ස්තූති පළ කිරීමේ ආකාර

ෂෙංලි: ආයුබෝවන් !你好! 'එදිනෙදා චීන බස'වැඩසටහනට අපි ඔබව සාදරෙන් පිළිගන්නවා.

කස්සප: 你好!

ෂෙංලි : පසුගිය වැඩසටහනින් අපි 'ආමන්ත්‍රණය'කිරීම ඉගෙන ගත්තා. අපි ආපහු ඒ දේවල් මතක් කරගමු නේ ද ?

කස්සප : හොඳ අදහස. අපි එහෙම නම් පසුගිය පාඩමේ සම්පූර්ණ සංවාදයට මුලින්ම සවන් දීලා ඉමු.

完整对话 සම්පූර්ණ සංවාදය

对话一 පළමු සංවාදය

A: 你好。ආයුබෝවන්.

B: 你好。ආයුබෝවන්.

A: 您好。ආයුබෝවන්.

B: 您好。ආයුබෝවන්.

对话二 දෙවන සංවාදය

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 我叫王龙。මගේ නම වං ලංන්.

A: 你叫什么名字? ඔයාගේ නම මොකක් ද?

B: 刘陆。ලියු ලු. (නමක්)

此为试读，需要完整PDF请访问：www.ertongb